**සී. කේ. චමින්ද මුතුමාල**
සහකාර සාමාන්‍යාධිකාරී
පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු අංශය, රාජ්‍ය දැව සංස්ථාව

# අධිවේගය මන්දගාමී කළ පණු කරඳ ශාකය

පණු කරඳ, හෙවත්, පඩු කරඳ, ශාකය වන සත්ත්ව සහ වෘක්ෂලතා ආඥා පනත යටතේ ආරක්ෂිත ලෙස නම්කර ඇති ශාකයකි. මෙය වෙල්, ඇළ, දොළ, ගංගා ආශ්‍රිතව වැඩේ. උද්භිද විද්‍යාත්මකව *Crudia zeylanica* ලෙස හඳුන්වයි. Fabaceae කුලයට අයත් මෙම ශාකය වර්ෂ 1868 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් මුල්වරට සොයා ගැනුනු අතර එය නෂ්ට වූ (Extinct) ශාකයක් ලෙසට IUCN ආයතනය විසින් 2006 වසරේදී රතු දත්ත පොතට ඇතුළත් කරන ලදි. පරිසර අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේදී එළි දක්වන ලද ජාතික රතු දත්ත ලැයිස්තුවට ද (National Red List) මෙය ඇතුළත් කර ඇත.

මෙරටට ආවේණික සේම මෙරටින් වඳවී ගිය ශාකයක් ලෙසට සැලකූ *Crudia zeylanica* ශාකය පිලිබඳව පුළුල් ලෙස වර්තමානයේදී කථාබහට ලක්වූයේ දැනට ශ්‍රී ලංකාවේ ඉදිවෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත - මීරිගම කොටස ඉදිකිරීමේදී ගම්පහ දාරළුව ප්‍රදේශයේදී මෙම ශාකයේ විශාල ගසක් හමුවී එය ඉදිකිරීම් සමාගම විසින් කපා ඉවත් කිරීමට සැරසෙන විටය. අදාල ස්ථානයේදී හමුවූ ශාකය උසින් අඩි 35 සහ වට අඩි හතරක් පමණ වේ.

පරිසරවේදීන් විසින් දාරළුවේදී හමු වූ පණු කරඳ ශාකය මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී කපා ඉවත් කිරීමට විරෝධය පෑ අතර ඒ හේතුවෙන් මෙම ශාකය පිළිබඳව මහජනතාවගේ උනන්දුව වර්ධනය වූ බව පෙනීයයි.

*Crudia zeylanica* වැඩුණු ශාක මේවන විට ස්ථාන කිහිපයකින්ම හමුවී ඇත. ගම්පහ සෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ ද වැඩුණු ගසක් දැකගත හැකිය. ඊට අමතරව මල්වාන බෙම්මුල්ල, හැන්දමහර, දොරණගොඩ වැනි ප්‍රදේශවලින්ද මෙම ශාක හමුවී ඇත. මෙම ශාකය ඇතුළු තවත් වඳවීමේ තර්ජනයට මුහණ පා ඇති ශාක පිලිබඳව පේරාදෙණිය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරියක් වන අචලා අත්තනායක මහත්මිය පර්යේෂණ කටයුතුවල නියැලෙන බවද පැවසේ. දාරළුවේදී හමු වූ පණු කරඳ ශාකය ආසන්නයේ ම වෙනත් පණු කරඳ ශාක ඇතිබව ද, මෙම ශාක ප්‍රචාරණය සඳහා තවාන් පාලන ක්‍රම භාවිතා වන බව ද පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ආචාර්ය සුභානි රණසිංහ මහත්මිය පැවසුවා ය.

ජෛව විවිධත්ව සංරක්ෂණයේදී ක්‍රම දෙකක් භාවිතා වේ. එනම් ස්ථානීය ජෛව විවිධත්ව සංරක්ෂණය (In-situ conservation) සහ පරිබාහිර ජෛව විවිධත්ව සංරක්ෂණය (Ex-situ conservation) යනුවෙනි. ස්ථානීය සංරක්ෂණයේදී ජෛව විවිධත්වයට අයත් ඕනෑම සංරචකයක් එය පවතින ස්ථානයේම නීති මාලාවක් සකස් කර සංරක්ෂණය කරනු ලබයි. මෙහිදී ස්වාභාවික වාසස්ථාන තුළම සංරක්ෂණය සිදුකරයි. පරිබාහිර ජෛව විවිධත්ව සංරක්ෂණයේදී ශාක හෝ සතුන් අභිජනනයත්, නඩත්තුවත් ඔවුන්ගේ ස්වභාවික

වාසස්ථානවලින් බැහැරව සිදුකෙරේ. මෙහිදී ස්වාභාවික වාසස්ථානවලට හැකිතාක් සමාන වූ පරිසර තත්ත්වයන් තිබීම වැදගත් ය.

ඉහත කරුණු සැලකිල්ලට භාජනය කළ විට *Crudia zeylanica* ශාකය සංරක්ෂණය සඳහා පහත ක්‍රියාමාර්ග ගත හැකිය.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනයේ පවතින ස්වාභාවික වනාන්තරවල හා වන උයන්වල සුදුසු ස්ථානවල මෙම පැළ රෝපණය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගත හැකිය.

- මෙම ශාකය දැනට දක්නට ලැබෙන ප්‍රදේශවල පාරිසරික සහ පාංශු තත්ත්වයන් පරීක්ෂා කිරීම.
- ඒ හා සමාන පාරිසරික හා පාංශු තත්වයන් ඇති ස්ථාන පරීක්ෂා කර මෙම ශාකය එම ස්ථානවල රෝපණය කිරීමට ඇති හැකියාව සොයා බැලීම
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, සමඟ එක්ව එම විශේෂයේ පැළ නිෂ්පාදන වැඩසටහන් පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීම.
- හඳුනා ගන්නා ලද යෝග්‍ය ස්ථානවල එම පැළ රෝපණය කිරීම.
- ඉහත ආකාරයට ස්ථාපනය කරන ලද පැළ ආරක්ෂාකර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

  එම පැළවල වර්ධනය හා අනෙකුත් තත්ත්වයන් පිළිබඳ අධීක්ෂණය කිරීම හා වාර්තා තබා ගැනීම,
- වනාන්තර තුළ හා ගෙවතුවල මෙම විශේෂය තිබේදැයි පරීක්ෂාකර එම විශේෂය ආරක්ෂා කර ගැනීම
- වනාන්තර තුළ හා දැනට හඳුනා නොගත් ස්ථානවල ඉහත ශාක විශේෂයට අයත් ශාක තිබේ දැයි සොයාබලා එම ශාක පිහිටි ස්ථාන හඳුනාගැනීම හා ඒවායේ පිහිටීම සිතියම්ගත කිරීම.

අධිවේගී මාර්ගයේදී හමු වූ පණු කරඳ ශාකය බේරා අධිවේගී මාර්ගය වෙනස් කිරීමට රුපියල් කෝටි 8600 ක් (රු. බිලියන 86 ක්) වැය විය හැකි බවද, මේ නිසා අධිවේගී මාර්ගය ඉදිකිරීම වසර එක හමාරකින් පමාවන බව ද ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉංජිනේරු W. K. කොඩිතුවක්කු මහතා දන්වා ඇති බව ඉරිදා ලංකාදීප පුවත්පතේ 2021 මාර්තු මස 21 වැනිදා මහතා විසින් යොමුකළ ලිපියක සඳහන් විණි.


උද්භිද උද්‍යාන දෙපාර්මේන්තුව විසින් මෙවන් පණු කරඳ ශාක ගණනාවක් විවිධ ස්ථානවලින් හමුවී ඇති බවට වාර්තා කර ඇති බැවින් අධිවේගී මාර්ගයේදී හමුවූ පණු කරඳ ශාකය ආරක්ෂා කිරීමට ශක්‍යතාවයක් ඇත්නම් එය පරිබාහිර සංරක්ෂණ ක්‍රියා මාර්ග භාවිතයෙන් සිදුකිරීම සුදුසු බව පෙනේ. මෙම ශාකය පරිබාහිර සංරක්ෂණ ක්‍රියාමාර්ගයකට ලක් කිරීම

හේතුවෙන් ගස මැරීයාමේ අවධානමක් ඇතිබව ඇතැමෙකු පැවසුව ද , මෙම ගස දැනට පවතින ප්‍රදේශය අවට පරිසර පද්ධතිය සම්පූර්ණයෙන් වෙනස් වී ඇති බැවින් මෙම ශාකය පවතින ස්ථානයේම තවදුරටත් දීර්ඝ කාලයක් නොනැසී පවතින බවද කිසිවෙකුට කිව නොහැකි වනු ඇත. මෙවන් සියළු කාරණා සලකා බලා පරිසරවේදීන්, ඉංජිනේරුවන්, විද්‍යාඥයින් සහ මහජනතාව සාධාරණ සම්මුතියකට එළඹ මෙම විවාදාත්මක කරුණ නිරවුල් කරගැනීම රටේ අභිවෘද්ධියට හේතුවනවා නොඅනුමාන ය.










*Crudia zeylanica*

## මූලාශ්‍ර

1. Dissanayake, M. D. and Fosberg, R.R. 1991.
*A Revised handbook to the flora of Ceylon, Amerined Publishing C. Newdelhi. P.98-99*

2. ජයකොඩි, සුනිල් ශාන්ත, 2021.
මධ්‍යම අධිවේගයට අවහිර වූ කරඳ ශාකය, ඉරිදා ලංකාදීප 2021.03.21

3. ගුණසේකර, සාලිය කුමාර, 2021.
අධිවේගී මග මැද මහණාවූ පඩුකරඳේ, සතිඅග අරුණ 2021.02.14

4. Websites: Fight for Crudia zeylanica tree rages,(Commentary by Eunice Ruth) Accessed on 29 March 2021

https://news.mongabay.com/2019/12/the-sri-lankan-legume-extinct-rediscovered-and-now-at-risk-again-commentary/ MONGABAY, The Sri Lankan legume: Extinct, rediscovered and now at risk again (Commentary by Jagath Gunawardena) Accessed on 29 March 2021

https://en.wikipedia.org/wiki/Crudia_zeylanica